# ළමා ප්‍රදීපය

ක්‍රි. ව. 2014 මාර්තු 03 සඳුදා
06 වෙළුම - 17 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 36/ News/ 2014



මිල රු 10/-

Photo By: Thilina Alahakoon CCP

## මරිය වසරේ දූ දරුවන් වෙමු අපි...

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611

ෆැක්ස් : 2692586 - ඊ-මේල් lamapradeepaya@yahoo.com

වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# ඉංග්‍රීසි දහම් පාසලටත් ළමා ප්‍රදීපය අත්වැලක්

## ආදරණීය දුවේ පුතේ...

දැන් ළමා ප්‍රදීපය තවත් ටිකක් අලුත් මුහුණුවරක් ගන්නයි යන්නේ. ළමා ප්‍රදීපයේ පිටු අතර මෙවර කළාපයත් සමඟ ඉදිරියේදී ද පිටු කිහිපයක් විවිධ දහම් කථා අනුසාර කරගෙන ඉංග්‍රිසි භාෂාවෙන් පළ කරන්නට අපි අදහස් කරන්නේ කාරණා කිහිපයක් මුල් කරගෙන බව පවසන්නට කැමතියි. ඒ අනුව දැන් සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් පැවැත්වෙන දහම් පාසල්වල අපේම දූ දරුවන්ට තවත් දහම් තෝතැන්නක් බවට ''ළමා ප්‍රදීපය'' පත්වෙන බව අප විශ්වාසයයි. ඒ තැනට ''ළමා ප්‍රදීපය'' ඔබ ගෙන යන බව අපගේ දැඩි බලාපොරොත්තුවයි.

ආදර දුවේ පුතේ,

ඉදිරියේදී ''ළමා ප්‍රදීපය'' ඔබ පුවත් පතේ එක් පිටුවක් වෙන් වෙනවා ඔබම නඟන ඒ වගේම ආගමිකව හා සමාජියව ඔබ මුහුණ දෙන සමහර ගැටළු වලට උපදේශනය මඟින් පිළිතුරු ලබා දෙන්නට භාෂා දෙකම උපයෝගී කර ගනිමින්. මෙහිදී ඉංග්‍රීසි හා සිංහල කතෝලික ධර්මෝපදේශය වඩාත් උපයෝගි කර ගන්නා අතර ඒ නඟන ප්‍රශ්න හා පිළිතුරු සඳහා කතෝලික වාග් කෝෂයේ නිවැරදි පදම යොදා ගන්නා නිසා ඔබේ භාෂා ඥානය දියුණු කර ගන්නටත් ඒකී විශේෂාංගය මහත්සේ උපකාරී වේවි.

ඒත් එක්කම කතෝලික ශුද්ධවන්තයින් ගැන හා විශ්ව සභාවේ අතීත කථා, කතෝලික සම්ප්‍රදායේ රසවත් කථා ආදිය චිත්‍රකථා ලෙසින්ද ඉංග්‍රීසියෙන් පළ කරන්නට ගන්නා උත්සහය ඔබට දහම් ඥානයත්, භාෂා ඥානයත් වැඩි වර්ධනය කරගන්නට මහඟු අත්වැලක් වන බවත් නිසැකයි.

ආදර දුවේ පුතේ,

දැන් ඔබටත් වැඩි අවස්ථාවක් මේ සමඟ ලැබෙනවා. ඒ කෙලෙසද? ළමා ප්‍රදීපය මාසිකව ඔබට ලබා දෙන මාතෘකාවන් ඔස්සේ අදහස් කරන වචන සංඛ්‍යාව අනුව කෙටියෙන් කතෝලික දහම් අනුසාරය උපරිමයෙන්ම අවබෝධ කරගෙන භාෂා දෙකෙන්ම රචනාවක් හෝ අර්ථාන්විත ලිපියක් ඔබට පුළුවන් ළමා ප්‍රදීපය වෙත යොමු කරන්නට. එහිදී හොඳම ලිපිය වෙනුවෙන් ඔබට ත්‍යාගයක් පිරිනැමීමට ළමා ප්‍රදීපය කටයුතු කරනවා. අප විශ්වාස කරනවා, මේ සඳහා ඔබ වඩාත් උනන්දු වී කතෝලික දහම නිවැරදිව අන් දරුවන් හා සමඟ බෙදා ගන්නටත් ඔබේම දහම් පිපාසය සංසිඳුවා ගන්නට වඩ වඩාත් ඔබේ කැපවීමත් මේ සඳහා අනිවාර්යයෙන්ම යොමු වේවි කියා. දැනටමත් ගම්පහ සිරි කුරුස කන්‍යාරාමයේ ළමා ප්‍රදීපය හා බෙහෙවින්ම සම්බන්ධ අපේ ලේඛිකාවියක් භාෂා දෙකෙන්ම දහම් උපයෝගි කරගෙන ලිපි ලියනවා. ඒ දියණිය කට පුරාම පවසනවා ළමා ප්‍රදීපය තුළින් ඇගේ දහම් දැනුම හා ලේඛන හැකියාව වර්ධනය කර ගන්නට මඟක් ශක්තියක් ලැබුණු බව. ඉතින් ආදර දුවේ පුතේ, ඔබ හැම කෙනෙක්ම හැකි යාවන් දියුණු කරගෙන අනාගතයේ කතෝලික දහමේ පරිනත ක්‍රියාධරයින් වන්නට දැන් සිටම මාර්ගය හෙළි පෙහෙලි කරගන්නට මේ ලැබෙන අවස්ථා වලින් උපරිම ප්‍රයෝජන ගත යුතුයි.

ඉතින් ඔබත් මේ සම්බන්ධයෙන් ඔබේ මීසමේ පියතුමාව දැනුම්වත් කරන්න, ඔබේ දහම් පාසලේ ගුරු මහත්ම මහත්මින්ව දැනුම්වත් කරන්න. ඔබේ සමීප යහළු යෙහෙළියන්ව මේ සම්බන්ධයෙන් දැනුම්වත් කරන්න. මේ මරිය වසර තුළ දහම් පාසල් දරුවන් හැටියට, ''මරිය වසරේ'' දූ දරුවෝ ලෙස ඉටු කරන්නට ලැබෙන විවිධ ක්‍රියාකාරකම් අතර මේ විශේෂාංගයත් ඔබ ඒ දින සටහනට ඇතුලත් කර ගන්නේ නම් අනිවාර්යයෙන්ම ඉදිරියේදී ඔබටත් දහමින් අනූන භාෂා ඥානයෙන් පිරිපුන් , අත් දැකීම් බහුල , පරිනත දහම් පාසල් ගුරුවරයෙක් , ගුරුවරියක් හැටියට ඔබේම ගමේ, ඔබේම මීසමේ, ඔබේම පාසලේ, කැපවීමෙන් කටයුතු කරන්නට හැකියාව ලැබෙනවා. අනාගතයේ එවන් පිරිසක් බිහිවනු දැකීම දැන් දැන් සිටම අපගේ ඒකායන බලාපොරොත්තුවයි. එය සිහිනයක් පමණක් නොව යථාර්ථයක් බවට පත් කරගන්නට ඔබේ කැපවීමත් දහස් වාරයක් අපි අපේක්ෂා කරනවා. එය ඉටු කරන්න ඔබට පුළුවන්.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා




# කොයි කිතුනු සභාවත් හරිද?

**4. පේදුරු තුමා සභා නායකයා වනු ඇත , නැත**

මෙසේ පාප් වහන්සේ සභා නායකයා ය යන්නත්, නායකයා නොවේ ය යන්නත් එක විට සත්‍ය විය හැකි ද? එක්කෝ කතෝලික ධර්මය අනුව, පාප් වහන්සේ සභා නායකයා යඃ නැති නම් අන් සභා පවසන හැටියට, පාප් වහන්සේ සභා නායකයා නොවේ. දෙකම විය නොහැකි යි. එබැවින් සත්‍ය සභාව විය හැක්කේද, මේ දෙකෙන් එකක් පිළිගන්නා සභාවය.

කොයි කිතුනු සභාවත් හරි ද යන ප්‍රශ්නය සම්බන්ධ යෙන් කොටින් කියන්නට තිබෙන්නේ මෙය යි. කිතුනු සභා රාශියකි. ඒ ඒ සභා උගන්වන ධර්මයන් අතර භේද ඇත. ඉහත දැක්වූ නිදසුන්වලින් පෙනෙන අයුරු පරස්පරවිරෝධි ධර්මයන් දෙකකින් සත්‍ය විය හැක්කේ එකක් පමණි. එබැවින් සත්‍ය සභාව විය හැක්කේද, එකිනෙකට විරුද්ධ ධර්මයන් උගන්වන සභා දෙකකින් එකකි. මෙසේ කොයි සභාවත් හරි ය යන්න තර්කානුකූල ව කොහෙත් ම පිළිගත නොහැක්කකි.

**3. ක්‍රිස්තුන් වහන්සේ සභාවක් ස්ථාපනය කළ සේක් ද?**

ශු. ත්‍රිත්වයේ දෙවන තෙම, ජේසුස් ක්‍රිස්තුස් වශයෙන් මිනිස් බව ගෙන මෙලොවට පැමිණියේ, තමන් වහන්සේගේ ආදර්ශයෙන් හා ධර්මයෙන් මිනිස් ජනයාට ධර්ම මාර්ගය පෙන්වා දෙන්නටත්, තමන් වහන්සේගේ ජීවිත පූජාවෙන් මනුෂ්‍යයන්ගේ පාපවලට වන්දි ගෙවන්නටත්, දේව වරප්‍රසාදයේ අනුග්‍රහයෙන් අනන්තකාලින ස්වර්ගානන්දය ලබා ගන්නට ඔවුන්ට මග සලසා දෙන්නටත් ය.

ක්‍රිස්තුන් වහන්සේගේ අභිප්‍රාය වූයේ, මිනිසා ස්වශක්ති යෙන් ම තමාගේ සදතන භාග්‍යය අත් කර ගැනීම ද? උන් වහන්සේගේ අදහස වූයේ, එක් එක් පුද්ගලයා උන් වහන්සේගේ ධර්මය තමාට හැකි පරිද්දෙන් තේරුම් ගැනීම ද? ඒ එසේ නම්, උන් වහන්සේගේ ධර්මය , බයිබලයේ ලේඛනගත ව තිබෙතත් විවිධාකාරයෙන් තේරුම් ගනු නො ලබන්නේද? ඇත්තටම , දැන් තිබෙන හැටියට උන් වහන්සේගේ ධර්මය නොයෙක් කිතුනු සභා විසින් භේද ව තේරුම් ගෙන ඇත. ඒ නිසා ම, ක්‍රිස්තු ධර්මයේ නියම අර්ථය දැන ගන්නට මඟක් තිබිය යුතු නොවේද? එවැනි මඟක් ක්‍රිස්තුන් වහන්සේ විසින් සපයා දී තිබේද ?

සිය අනුගාමිකයන් උදෙසා ක්‍රිස්තුන් වහන්සේගේ සැලැස්ම වූයේ ඔවුන් තම තමන්ගේ ශක්තියෙන් ස්වර්ගික භාග්‍යය අත්කර ගැනීම ද? නැත හොත් ඒ පරමාර්ථය ඉටු කර ගැන්මට ඔවුන්ට සහාය වීම සඳහා උන් වහන්සේ විසින් සසුනක් හෙවත් සභාවක් ස්ථාපනය කරන ලද්දේ ද?

දෙවියන් වහන්සේගේ භෞතික මැව්ලි අතරෙන් අග තැන ගන්නේ මිනිසා ය. චින්තන ශක්තියත් ස්වේච්ඡා බලයත් ඇත්තේ මිනිසාට පමණි. තමන් වහන්සේගේ ඒ උතුම් මැවිල්ල දෙවියන් වහන්සේ සැම විටම උතුම් කොට සලකන සේක. මිනිසා පිළිබඳ තමන් වහන්සේගේ සැලැස්මට, මිනිසා සහභාගි කර ගන්නා සේක.

තමන් වහන්සේගේ සාධන බලයට මිනිසා පංගුකාරයකු කර ගැනීම එබඳු එක් අවස්ථාවකි. මිනිස් දරුවකු ජනිත කරවීමට, උන් වහන්සේ මවු පිය යන දෙදෙනකුගේ සහයෝගය මාර්ග කර ගන්නා සේක. මිනිස් ජාතියේ යහපත පිණිස, කලාව , සාහිත්‍යය, සංගීතය, විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, තාක්ෂණය වැනි ක්ෂේත්‍රයන්හි නිර්මාණයන් සඳහා ඇතැම් පුද්ගලයන්ට දක්ෂතාවක් දනය කර, ඔවුන්ගේ සහයෝගය උපයෝගි කර ගන්නා සේක.

මිනිසාගේ ලෝකෝත්තර ශුභසිද්ධිය සඳහා ද ක්‍රිස්තුන් වහන්සේ එබඳු ම පිළිවෙතක් අනුගමනය කර ඇති බව පෙනේ. එනම්, තම අනුගාමිකයන්ගේ අන්‍යෝන්‍ය අධ්‍යාත්මික ශුභ සාධනය සඳහා උන් වහන්සේ ඔවුන්ගෙන් ම යුත් සසුනක් පිහි-ටුවා ඇත. යම් සසුනක් , සභාවක් හෝ සමාජයක් අංශ තුනකින් යුක්ත වේ. (1) සාමාන්‍ය සභිකයෝ, (2) නිලධාරීහු, (3) සභාපති හෙවත් නායකයා . ක්‍රිස්තුන් වහන්සේ විසින් මේ අංශ තුනෙන් යුත් සභාවක් පිහිටුවන ලද බව බයිබලයෙන් ම ඔප්පු වේ.

**(1) ක්‍රිස්තු සභාවේ සභිකයෝ**

ක්‍රිස්තුන් වහන්සේගේ ආදර්ශවත් ජීවිතය දුටුවන්ගෙන් ද උන් වහන්සේගේ ධර්මයට සවන් දුන්නවුන්ගෙන් ද සමහරෙක් උන් වහන්සේගේ අනුගාමිකයෝ වූහ. ඇතැමෙක්, ශ්‍රාවකයන් වීම සඳහා උන් වහන්සේ විසින් ම කැඳවන ලද්දෝ වූහ. (මතෙව් 4:18-22,9:9, ලූක් 5:1-11) උන් වහන්සේ සමග කිට්ටුවෙන් ගැවසුණු ශ්‍රාවකයෝ දොළොස් දෙනෙක් ද (ලූක් 6:13-16) අන්‍ය ශ්‍රාවකයෝ හැත්තෑ දෙනෙක් ද (ලූක් 10 :1) සිටියහ.

**ඩබ්ලිව්. එල්. ඒ. දෙන් පීටර් පියතුමන්ගේ**
**ග්‍රන්ථයක් ඇසුරිණි.**

**ඉදිරියට .......**

**පසුගිය සතියෙන්.....**

# අරුම පුදුම බැංකුව

දැන් ඔයාලට තේරෙනවා නේද අපි වැඩක් නොගෙන ඉතිරි වෙන කිසිම මිනිත්තුවක් තියා, තත්පරයක්වත් කිසිම කෙනෙකුට දෙන්නට බැරි බව. දැන් ඉතින් ඔයාලා කවුරු හරි කියන්න බලන්න මේ අරුම පුදුම බැංකුවෙ නියම ඵල ලබන්න නම් මොනවද අපි කරන්න ඕනේ කියා.



ලලනී අතක් ඉස්සුවා ගුරුතුමා ඇයට සංඥා කළා ඇගේ අදහස ඉදිරිපත් කරන්න. ''සර්, අපට ලැබිලා තියන හැම මිනිත්තුවක්ම අප විසින් ප්‍රයෝජනවත් ලෙස හසුරවන්න ඕනේ'' කියලා.

''හරියට හරි'', ගුරුතුමා කීවා. '' බලන්න තව කෙනෙක් කියන්න ප්‍රයෝජනවත් ලෙස හැසිරවීම කොහොමද අපි විග්‍රහ කරන්නේ කියලා''.

රනිල් තමන් වාඩි වී සිටි පුටුවෙන් නැගිට මෙහෙම උත්තර දුන්නා. ''රටට සේවය කිරීමෙන්.'' කියලා. ඉතින් ගුරුතුමා කීවා ''අපි කටින් එක පාරටම රටට සේවය කරනවා කිවුවාට මදි . අපි කාටද ඉස්සර වෙලාම සේවය කරන්න ඕනෑ කියලා කියන්න බලන්න.'' රනිල් තව ටිකක් කල්පනා කළා. උත්තරයක් දෙන්න තරමක් ප්‍රමාද වු නිසා ගුරුතුමා විස්තර කරන්න පටන් ගත්තා.




''දරුවනේ ඉංග්‍රීසි භාෂාවෙන් කියමනක් තියෙනවා'' චැරිටි බිගින්ස් ඇට් හෝම්'' කියලා. ඒ කියන්නේ අපි කරන කියන සෑම දේම අපේ පවුල් තුළින් තමයි පටන් ගැනෙන්න ඕනේ. එහෙම නැත්නම් ඉස්මතු වෙන්න ඕනේ. අපි පවුලක් වශයෙන් හරියට බෙදා හදා ගන්නවාද? අපේ දෙමව්පියන්ට සහෝදර සහෝදරියන්ට උදව් උපකාර වෙනවාද? ඊළඟට , අපි පාසලේදී නිසියාකරව අපේ යුතුකම් ඉටු කරනවාද? පාසල් අධ්‍යාපනය තුළින් අපි සමාජයට යන විට සමාජයේ සාමූහික ක්‍රියා වලට අපි නො පැකිලව ඉදිරිපත් වෙනවාද?

දැන් බලන්න අපට කුඩා කාලයේ ඉඳලම මොනතරම් වැඩ කොටසක් තියනවද කරන්න කියලා. ඉතින් මේ සැමදේටම තමයි අපට අර තරම් විශාල තත්පර ප්‍රමාණයක් දෙවියන්ගෙන් ලැබිලා තියෙන්නේ.

අන්න දැන් මේ දරුවන්ට තේරෙනවා නේද අපට මේ ලැබී තිබෙන ''කාලය'' නැමති ගිණුම මොන තරම් අපට වටිනවද කියලා? ඉතින් දැන් අපි මොකක්ද මේ අරුම පුදුම ගිණුම ගැන ගන්න අවසාන තීරණය? '' ගුරුතුමා ඇසුවා.

දරුවන් නිශ්ශබ්දව ගුරුතුමා දෙස බලා සිටියා. ඔහු සිනාමුසුව මෙහෙම කීවා. ''ඔන්න එහෙනම් මං කියන දේම මං කීවට පස්සේ ඔයාලත් කියන්න ඕනේ . හරිද? '' සෑම දෙනාම හිස් සොලවා, ගුරුතුමා කී වචන ශබ්ද නඟා උච්චාරණය කළා.

**"අපි සෑම විටම කාලය අපතේ නොයැවෙන ලෙසට වැඩ කටයුතු කරන්න පුරුදු වෙන්න ඕනෑ."**

''බොහොම අපූරුයි..... බොහොම අපූරුයි'' කියමින් ගුරුතුමා අත්පොලසන් දුන්නා. සියලුම දරුවන්නේ මුහුණු ''අධිෂ්ඨානය'' සමඟ පිරුණු සතුටකින් පිරී ඉතිරී යනු දුටු ගුරුතුමත් බෙහෙවින්ම සතුටට පත් වූවා.

**ෆ්‍රීඩා විල්ලවරායන් - ටොරොන්ටෝ, කැනඩාව**

## මාසික සිතිවිල්ල

**මාසික සිතිවිල්ල**

''පෙබරවාරි මාසය"
ළමා ප්‍රදීපය,
අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය
මාවත,
කොළඹ 08.



**ජයග්‍රාහී නිර්මාණය ලබන සතියේ පළ කෙරේ**

# චතාරික සමය

**2014 මාර්තු 05 අළු බදදා දිනෙන් ඇරඹෙන චතාරික සමය නිමිත්තෙනි.**



**ආදර දුවේ පුතේ,
අළු බදදා අප
සිහිපත් කරන්නේ
ස්වාමින්
වහන්සේගේ
දුක්ප්‍රාප්තියේ
ආරම්භක
දවසයි. එදා සිට
මහ සිකුරාදා
දක්වා
උන්වහන්සේ
පියාණන් වහන්සේගේ
කැමැත්තට අවනත
වී, අප වෙත ඇති අසීමිත
ආදරය වෙනුවෙන් කුරුසියේ මරණය
දක්වා ගත කළ ජීවිතය මෙනෙහි කරමු.**

අපි අපගේ දෙමව්පියන්ට එසේ ආදරය කරනවාද? ප්‍රශ්නයක්. එකට එක කියනවා නොවේද? ලේ කිරි කර පොවා උස් මහත් කර අපට අධ්‍යාපනය ලබා දී සමාජයේ උසස් නිලතලයකට පත් කිරීම ඔවුන්ගේ එකම අභිලාෂයයි. ඉතින් අපි ඔවුන්ට කෙසේ තුති පුදම්ද?. ස්වාමින් වහන්සේ මෙන්ම අපිත් අපගේ අසීමිත ආදරය දෙමව්පියන්ට පිදිය යුතුයි.

අළු බදදා සිට දින 40 ක කාලයක් ස්වාමින් වහන්සේගේ ශ්‍රී මරණය සිහිපත් කිරීම සඳහා සභා මාතාව වෙන්කරන ලදී. මේ කාලය වරප්‍රසාදීය උල්පත් තුළින් ජීවන ජලය ගලා ගලා එන කාල පරිච්ඡේදයයි. එමනිසා පසුතැවිලි වී ඔබගේ පාපයන්ට දුක්මනස්ථාපනය වන්නැයි ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරයි. උපවාසයෙන්ද , වැලපීමෙන්ද, මුළු සිතින් "දැන්වත් මා වෙත හැරී එන්න" වත ඉරාගෙන නොව සිත ඉරාගෙන නුඹේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න. (ජොවෙල් 2:12-13)

අපගේ දෛනික ජීවිතයේ අධ්‍යාපනයට මුල් තැන දෙනවා සේම අධ්‍යාත්මික ජීවිතය තුළිත් මේ සුවිශේෂ වූ කාල පරිච්ඡේදය තුළ දෙවියන් වහන්සේට මුල් තැන දිය යුතුයි. දිනකට විනාඩි 5 ක් වත් උන්වහන්සේගේ ශ්‍රී මරණය මෙනෙහි කළ යුතුයි. එම නිසා ආදර දුවේ පුතේ මෙලෙස අපි ස්වාමීන් වහන්සේ වෙත මොහොතකට හැරී උන්වහන්සේගේ වරප්‍රසාදයන් බහුලව ලබාගෙන ශුද්ධාත්මයාණන් වහන්සේ දෙවා වදරණ ප්‍රඥාව නැමති උතුම් තිළිණය හිමිකරගෙන ජීවිතය සාර්ථක කර ගැනීමට ස්වාමින් වහන්සේ තුළ යැපෙමු.

**මයිකල් සෙබස්තියන් සෝමරත්න මාමා**

# දේව ආදරය

කෙටි කතාව



මුළු පන්තියම හරිම නිශ්ශබ්දයි. හැම දෙනාම ටීච දීපු ප්‍රශ්න පත්‍රයට උත්තර ලියනවා. ඒත් තවම මම එක ප්‍රශ්නෙකටවත් උත්තර ලියලා නෑ. මට මතක්වෙන්නේ ඊයේ ගෙදර වුණු සිද්ධිය . ඊයේ පොඩිමාමා ගෙදර ඇවිත් අම්මට බැනපු විදිහට මට ගොඩක් බය හිතුනා. අම්මාගේ ඇස්වල කඳුළු පිරිලා තිබුණා අක්කා කාමරෙන් එළියටවත් ආවේ නෑ. මම පොඩි හින්ද පොඩි මාමා කියපු දෙවල් එච්චර තේරුණේ නෑ. ඒත් ඉක්මනට මගෙ ණය ගෙවපල්ලා කියනවා නම් ඇහුණා. අපේ තාත්තා නැතිවෙලා ගොඩක් කල්. තාත්තා ඉන්න කාලේ නම් අපිට කිසිම අගහිඟයක් තිබුණේ නෑ. ඒත් තාත්තාට ලොකු ලෙඩක් තිබුණා. තාත්තව බේරගන්න අපේ හැම සතයක්ම වියදම් කළා. පොඩිමාමාට ගේ උකස් කරලා ලොකු ණයකුත් ගත්තා. ඒත් ඒ හැම දෙයක්ම අපතේ ගියා. ඒ තාත්තා නැතිවුන දවසේ. ඊට පස්සේ අම්මා අපිට කන්න දුන්නේ පාලම ලඟ කඩේට කිරි විකුණලා.

අම්මා ගැන මටත් ගොඩක් දුකයි. ඒත් මොනවා කරන්නද? මම හිටියෙ මගේම ලෝකෙක තනිවෙලා. දම්මි ප්‍රශ්න වලට උත්තර ලියලා ඉවරද?'' එතකොට තමයි මාව රත්වුණේ එක ප්‍රශ්නෙකටවත් උත්තර ලියලා නෑ. හැම ළමයම උත්තර ලියලා ඉවරයි. මට ටීච දිහා බලන්නත් බයයි. ''ටීච මට උත්තර ලියන්න බැරුව ගියා'' මම බිම බලාගෙනම කිව්වා. මුළු පන්තියම මට හිනාවෙනවා. ටීචගේ මූණ තරහෙන් කළු වෙලා. ''ඉන්ටවල් එකට මාව හම්බවෙන්න'' කියා ටීචර් තරහෙන් එළියට ගියා. ඇය ගිය ගමන් මගේ යාළුවෝ මාව වටකරගෙන මොකදවුණේ කියලා අහනවා. මට කියන්නත් ලැජ්ජයි. මම හිනාවෙලා බිම බලා ගත්තා. ඉන්ටවල් එකට බෙල් එක ගැහුවා. කන්න දෙයක් ගෙනාවෙත් නැතිනිසා වතුර ටිකක් බීලා ටීචව හම්බවෙන්න ගුරුවිවේකාගාරයට ගියා. ටීච හිටියේ තනියම ඒ නිසා මම ඇතුලට ගියා. ටීච මාව ළඟට අරගෙන උත්තර ලිව්වේ නැත්තේ ඇයි කියලා ඇහුවා. මට නිකම්ම ඇඬුනා මම ටීචට ඔක්කොම විස්තරේ කිව්වා. කතාව ඉවරවුණු ගමන් ටීච මගේ ඔළුව අතගාලා ගෙදර ලිපිනය ඉල්ලගත්තා. ඊට පස්සේ මට බිස්කට් එකකුත් දීලා පන්තියට යන්න කිව්වා. ගෙදර ගියගමන් හැම විස්තරයක්ම මම අම්මට කිව්වා. පහුවෙනිදා ටීච අපේ ගෙදර ඇවිත් අපේ හැම විස්තරයක්ම අහගෙන ආයි එනවයි කියලා යන්න ගියා. සතියකට විතර පස්සේ ටීච අපේ ගෙදර ආවේ පල්ලියේ පියතුමත් එක්ක. ගමේ හිටපු පෝසත් මහත්තයෙක් අපේ ගේ බේරලා දෙන්න පොරොන්දුවෙලා. මටයි අක්කටයි ශිෂ්‍යත්ව දෙකක් දෙන්න පොරොන්දු වුණා. අම්මාට හරි සතුටුයි. ඔන්න දුවේ ජේසු අපිට පිහිට වෙලා කියන ගමන් අම්මා මාවයි අක්කවයි තුරුල් කර ගත්තා.

**හිරුණි රංසිකා
10 ශ්‍රේණිය
ශා. ඉසිදෝරු දහම් පාසල - තිබ්බටුගොඩ**

# 2014 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## පළමු තේමාව - ලෝකය තුළ පවතින දේව ක්‍රියාකාරීත්වය - පසුගිය ප්‍රශ්න එකතුව (2008 - 2012)

21. ආධ්‍යාත්මික ශරීරයේ වර්ධනය සඳහා ඔබ පිළිපැදිය යුතු ප්‍රතිපත්ති කරුණු පහකින් විස්තර කරන්න. (2011/02.3)

22. දෙවිඳුන්ගේ මහිමයෙන් සිදුකළ නව සොයා ගැනීම් හේතුකොට ගෙන ප්‍රසිද්ධ වූ විද්‍යාඥයින් දෙදෙනෙක නම් කරන්න. (2012/02.1)

23. මිනිසාගේ ආරම්භය හා පැවැත්ම ගැන ඉදිරිපත් කර ඇති විවිධ න්‍යායන් දෙකක් නම් කරන්න. (2012/04.01)

24. වර්තමාන මනුෂ්‍යයාගේ ප්‍රබලතා තුනක් ලියන්න. (2012/03.1)

25. නූතන ලෝකයේ මනුෂ්‍යයාගේ ප්‍රබලතා දෙකක් ලියන්න .(2012/03.2)

26. කෙටි සටහන් ලියන්න. ''නව යොවුන් වියේ ගැටලු'' (2012.07.1)

27. කෙටි සටහන් ලියන්න. ''දේව මැවිල්ලක් වූ සොබාදහම සුරකිමු.'' (2008.07.5)

28. දේව මැවිල්ලක් වන ඔබ සමාජයට ඉටු කරන කාර්යයන් පහක් වචන 75 කින් පමණ විස්තර කරන්න. (2009.02.3)

29. ''විද්‍යාව හා තාක්ෂණය මගින් දේව මහිමය වඩ වඩාත් අනාවරණය කර ගත හැකිය'' යන අදහස සනාථ කිරීමට කරුණු පහක් ඉදිරිපත් කරන්න. (2012.03.3)

### 1.2 ආදි පීතෘවරු

30. ආදි පිතෘ ආබ්‍රහම්ගේ ජීවිතයේ පිළිබිඹු වූ විශේෂිත ලක්ෂණය කුමක්ද? (2009.01.1)

31. දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දෙන ලද පොරොන්දු දෙකක් ලියන්න (2010.01.1)

32. දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමඟ කළ ගිවිසුමට බැඳෙන් නේ (2011.02)

33. ආබ්‍රහම් ධර්මිෂ්ඨයකු බව සනාථ කළේ දෙවියන් වහන්සේ ගේ ...... නිසාය. (2011.01)

34. උත්පත්ති 26,27 පරිච්ඡේදවලට අනුව දේව ක්‍රියාකාරිත්ව නිසා බලවතකු බවට පත්වූ නිහඬ මිනිසා වන්නේ. (2011.03)

35. ජාකොබ් නිසා ඒසව්ට සිදු වූ අසාධාරණය වන්නේ (2010.17)

36. පැරණි ගිවිසුම තුළ දේව අනාවරණයේ වැදගත් කාර්යභාරයක් ඉටු කළ දෙපිරිස වන්නේ....... (2008.04)

ගරු ඩේමියන් පෙරේරා පියතුමා



කළුතර, නාගොඩ මීසමේ දහම් පාසලේ ශිෂ්‍ය නායක නායිකාවන් 20 දෙනෙකුට පදක්කම් පැළඳවීම පසු ගියදා කළුතර නාගොඩ ශු. මිඛායෙල් අග්‍රදූත දේවස්ථානයේදී පැවැත්වුනි. මෙහිදී මෙම වසරේ දහම් පාසල් ඇරඹූ සපුගහවත්ත ශු. ජේරාඩ් මජේල්ලා දහම් පාසලේ ශිෂ්‍ය නායකයින්ටද පදක්කම් පැළඳවීම විශේෂත්වයකි.

නාගොඩ, සපුගහවත්ත දහම් ගුරු භවතුන්ගේ සහයෝගයෙන් නාගොඩ මීසම් සේවක ගරු නිර්මාල් මාලක සිල්වා පියතුමන්ගේ අනුශාසකත්වය මත සියලු කටයුතු සංවිධානය කෙරිනි. පදක්කම් පැළඳි ළමුන් ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. **රංජිත් නෝනිස්**

# ''මිණි උදන'' ජාතික නත්තල් සඟරාවෙන් මෙවර පාස්කුවට චිත්‍ර හා රචනා තරගයක්.

ශ්‍රී ලාංකීය නත්තල් සඟරා ඉතිහාසයේ තවත් සුවිශේෂී පිටුවක් පෙරලමින් ශ්‍රී ලාංකීය කිතුනු දූ දරුවන් වෙනුවෙන් චතාරික හා පාස්කු සමය වෙනුවෙන් ප්‍රධාන කාණ්ඩ 4 ක් යටතේ චිත්‍ර හා රචනා තරගයක් පැවැත්වීමට ''මිණි උදන'' ජාතික නත්තල් කලාපයේ කාර්ය මණ්ඩලය කටයුතු යොදා ඇත.

කාණ්ඩ 4 ක් යටතේ පැවැත්වෙන මෙම තරග පදවි මට්ට මින් පවත්වනු ලබයි. මෙම තරග සිංහල හා දමිල භාෂා දෙකෙන්ම පැවැත්වෙන අතර එක් පදවියකින් ප්‍රථම , දෙවන, හා තෙවන යනුවෙන් ප්‍රධාන ස්ථාන 12 ක් තෝරා ගන්නා අතර සා: පෙළ හා උසස් පෙළ දරුවන්ගෙන් එක් පදවියකින් 20 දෙනෙකු තෝරා ගැනේ. ප්‍රධාන ස්ථාන 12 සඳහා වටිනා ත්‍යාග ලබාදීමට කටයුතු යොදා ඇති අතර ඉතිරි 20 දෙනාට මිණි උදන විශිෂ්ට සම්මාන සහතිකය පිරිනැමේ.

**3 වන ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා චිත්‍ර තරගය**

මැවිල්ල නිති සුරකිමු . අඟල් 18×22 ප්‍රමාණය

**6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා රචනා තරගය**

ඔබ කැමති එක් මාතෘකාවක් පමණක් තෝරා ගන්න.

- නිකළැල් ජීවිතයේ ආදර්ශය මරිය උත්තමාවියයි
- දුගී ගිලනුන් සනසා සිත් පහන්කළ තෙරේසා මව්තුමිය
- ආසියාකරයේ අසහාය ධර්මදූතයාණන් වූ සෙන්කෝලයේ ශුද්ධවූ ළදරුවා (වචන 175 ක් පමණ)

**10 ශ්‍රේණිය 11 ශ්‍රේණිය සඳහා (සා.පෙළ) රචනා තරගය**

- මනුෂ්‍යත්වය දේවත්වය කරා එසවූ උත්ථානය
- මා ඔබගේ පාද සේදුවාක් මෙන් ඔබත් එකිනෙකාගේ පාද සෝදන්න.
- පිලාත් සහ ජුදස් අදත් අප අතර
- තාක්ෂණයේ කිරුල සොයන වර්තමානය තුළ දුප්පතුන්ගේ සහාවක ගමන් මග කෙලෙස විය යුතුද?

(වචන 250 ක් පමණ)

**12 හා 13 ශ්‍රේණි සඳහා උසස් පෙළ රචනා තරගය**

- දුප්පතුන්ගේ සභාවක් දිළිඳුන්ගේ සභාවක් මම දකින්නට කැමැත්තෙමි.
- මම පිපාස වෙමි.
- මෙවර වත් අපි එතෙර වෙමුද?
- ඔබ අතරින් පවක් නැති තැනැත්තා පළමු ගල ගසන්න.

(වචන 350 ක් පමණ )

ඔබගේ නිර්මාණයෙහි ඔබගේ තොරතුරු කිසිවක් සඳහන් නොකරන්න. එම නිර්මාණයෙහි තම මීසම් භාර පියතුමා ගේ නිර්දේශය පමණක් සඳහන් කරන්න. ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, දුරකථන අංකය, දහම් පාසල, ශ්‍රේණිය, පදවිය, හා මීසම යන තොරතුරු වෙනම ලියා නිර්මාණයේ අමුණා පහත ලිපිනයට 2014 අප්‍රේල් 10 වන දිනට පෙර අප වෙත යොමු කරන්න.

**සංස්කාරක :- ජෝශප් ජයසිරි ප්‍රනාන්දු ,**
**"මධුකුමරි" A 179/21, මාදොල, අවිස්සාවේල්ල**

වැල්ලවත්ත ශා. ලෝරන්ස් කන්‍යාරාමයේ නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවය පසුගියදා බම්බලපිටිය පොලිස් ක්‍රීඩාංග නයේදී පැවැත්වුනි. ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස චිත්‍රපට අධ්‍යක්ෂ සෝමරත්න දිසානායක මහතා සහ එම මැතිනියද එක්වූණි. මෙදින අවස්ථාවක් සේයා රුවෙහි දිස්වේ.

**ශ්‍යාමලී ප්‍රියංගිකා**





කඩලාන ශා. අන්තෝනි විදුහලේ නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවය පසුගියදා එම විදුහල් ක්‍රීඩා පිටියේදී පැවැත්විණි. කඩලාන මීසම් සේවක ගරු ලලිත් පෙරේරා පියතුමා , ආදී ශිෂ්‍ය මොරටුව පුරපති සමන්ලාල් ප්‍රනාන්දු මහතා , ග්‍රාම වාසී වයස 19 න් පහළ ජාතික යොවුන් ක්‍රිකට් කණ්ඩායමේ නායක කුසල් මෙන්ඩිස් ද ප්‍රධාන ආරාධිතයින් ලෙස මේ අවස්ථාවට එක් වුණි. විදුහලේ සිසුන්ගේ සරඹ සංදර්ශනයේ එක් අවස්ථාවක් ළමා ප්‍රදීපය කැමරාවට හසුවූ අයුරු.

**සුරත් ද සිල්වා**

# අළු බදාදා ගැන ඔබ මේ ක



**චතාරික සමය ආරම්භ කරන අළු බදාදා පාස්කු ඉරිදට දින 46 කට පෙර යෙදේ. එය වසරින් වසර වෙනස් විය හැකි මුත් වාර්ෂික දින දර්ශනයේ වේලාසනම දිනය විය හැකි වන්නේ පෙබරවාරි 4 වන අතර වඩාත් ප්‍රමාදම දිනය ලෙස යෙදිය හැකි වන්නේ මාර්තු 10 වැනිදටය.**

මතෙව් , මාක් හා ලූක් සුවිශේෂයන්ට අනුව ජේසුස් වහන්සේ සිය ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කිරීමට පෙර පුරා දින 40 ක් පාළුකරයේ උපවාසයේ යෙදුනාහ. එහිදී සාතන් වරින් වර උන්වහන්සේ පරීක්ෂාවට ලක්කළද උන්වහන්සේ ඌට ගොදුරු නොවූහ. අළු බදාදා ඒ අනුව කිතුනු සම්ප්‍රදාය තුළ උපවාසයේ , යාච්ඤාවේ හා එක්වරුශීලය රැකීමේ සමයක් වන කොරැස්මය ආරම්භ කරයි. මේ කාල සීමාව තුළ ඉරිදා 6 ක් යෙදෙන අතර සබත් දින චාරිත්‍රය අනුව එම දින එක්වරු ශීලය හෝ උපවාසයේ දිනයන්ට අයත් නොවේ.

අළු බදාදා අළු නළලත තැවරීම ලොව පුරා කිතුනු භක්තිකයන් සිදු කරති. මානව වංශ කතාවේ මරණය හා පසට හැරීම සංකේතවත් කරමින් දෙවියන් වහන්සේට අපගේ ඒකායන ප්‍රේමය තුළ මරණය වැළඳගැනීම ඉන් සංකේතවත් වේ. සාමාන්‍යයෙන් නළලත තැවරීමට අළු ලබාගන්නේ කලින් වසරේ ගොබ් ඉරිදා දින ආසිරි ගැන්වූ ගොබ් කුරුස දවා ගැනීමෙනි. මෙසේ දවා ගැනීමෙන් ලැබෙන අළු වලට ආසිරි පැන් මිශ්‍රකර නළලත කුරුසියේ ලකුණ සලකුණු කිරීමට අවශ්‍ය පරිදි සකසා ගනී.



සමහර විදේශීය රටවල ආසිරි පැන් වලට අමතර ඔලිව් තෙල්ද මිශ්‍ර කැරේ. කතෝලික සම්ප්‍රදාය අනුව අළුබදාදා එක්වරු ශීලය රැකීමත් ගොඩමස් වලින් වැලකීමත් සිදුවේ. වයස අවුරුදු 18 සිට 59 දක්වා යහපත් ශරීර සෞඛ්‍යයෙන් හෙබි අයට එක්වරු ශීලයරැකීම කතෝලික සසුන් නියමයයි.



බටහිර රටවල අළු බදාදාට පෙර යෙදෙන අඟහරුවාදා ගොඩමස් අනුභව කරන්නටම වෙන්වූ දිනයකි. නෙදර්ලන්තය වැනි රටවල සැණකෙළි විනෝද මේලා සියල්ල එම අඟහරුවාදා දින අවසන් කෑරේ. 17 වැනි සියවසේදී අළු බදාදා දින අළු තැවරුවේ හිසමත යැයි මතයක් පවතී, වර්ෂ 1881 දී පෝලන්ත ජාතික ජූලියන් හලාට් (1853 -

# රුණු දන්නවාද



1929) විසින් ඇඳින ලද මේ සිතුවම් දක්වන්නේ අළු බදදා හිසමත අළු තවරන අන්දමයි.

ඒ අතර අතීතයේදී ඇතැම් දෙව්මැඳුරක අළු බදදා මෙහෙයට පැමිණ සිටින සැදැහැ වතුන් අතර කොළ කැබලි බෙද දුන් අතර ඒ වායේ සමාව ලබා ගැනීමට බලාපොරොත්තුවන පාපය සටහන් කර අල්තාරය මත තබා ඇති බඳුනට දමන්නට නියමකර ඒ සියල්ල පුළුස්සා දමයි. මේ අතර ඕලන්ද ජාතිකයෝ ලුණු දැමූ හුරුල්ලන් අළුබදදා දිනයේ අනුභව කරන්නේ සැණකෙළි හා විනෝද මේලා අවසාන කරන්නටය. වික්ටෝරියානු යුගයේදී එංගලන්තයේ අළු බදදා නාට්‍ය රඟ දක්වනු ලැබීය. පාස්කු නාට්‍යවල තවත් එක් පැතිකඩක් ලෙස එය දැක්විය හැකිය.

මේ වසරේ දී අළු බදදා යෙදී ඇත්තේ මාර්තු 05 වැනි දටය.

2015- පෙබරවාරි 18 , 2016 පෙබරවාරි 10 , 2017 මාර්තු 01 , 2018 පෙබරවාරි 14 , 2019 මාර්තු 06 , 2020 පෙබරවාරි 26 , 2021 පෙබරවාරි 17 , 2022 මාර්තු 02 , 2023 පෙබරවාරි 22





කිතුනු උරුමය

අළු බදදා යෙදිය හැකි වේලාසනම දිනය පෙබරවාරි 04 බැව් මීට පෙරද සඳහන් කළ අතර එම වසරේ (සාමාන්‍ය වසරක් නම් පාස්කුව යෙදෙන්නේ මාර්තු 22 වැනිදය.




මෙය 1573, 1668 , 1761 සහ 1818 වසරවල යෙදුණු අතර මීලඟට එසේ යෙදෙනුයේ 2285 අවුරුද්දේදී ය. අළුබදදා යෙදිය හැකි ප්‍රමාදම දිනය මාර්තු 10 වන විට එම වසරේ පාස්කු ඉරිදා අප්‍රේල් 25 වැනිදට යෙදේ. එදින වලට අළු බදදා හා පාස්කු ඉරිදා 1546, 1641 , 1736, 1866 සහ 1943 වසර වල යෙදුන අතර මීළඟට 2038 වසරේදී එසේ යෙදේ.

අළු බදදා කිසිදක අධික අවුරුද්දක පෙබරවාරි 29 වැනිදවක යෙදෙන්නට ඉඩක් නැති අතර වර්ෂ 2096 දක්වා එසේ යෙදෙන්නට ඉඩක්ද නැත. තෙවන සහස්‍රකයේ අළු බදදා පෙබරවාරි 29 වැනිද දිනයට යෙදෙන සෙසු වසර ලෙස 2468 , 2688 , 2840 , සහ 2992 දැක්විය හැකිය. අධික අවුරුද්දක අළු බදදා පෙබරවාරි 29 වැනිදට යෙදෙනුයේ පාස්කු ඉරිද අප්‍රේල් 15 වැනිදට යෙදෙන විට පමණී.

ශිරාන් මෛත්‍රි

# බෝපිටිය ලොයලා විදුහලේ සිසුවියකගෙන් කවි පොතක්




අනුරාධා නිමාෂි

පැහැබර අනාගතයක සුබ ලකුනු ඉඟිකරන පුංචි කිවිඳියක් , පුංචි ලේඛිකාවක් බෝපිටිය මීසම තුළ සුවඳ විහිදුවමින් සිටී. ඇය අනුරාධා නිමාෂි නම් වන්නීය. බෝපිටිය ලොයෙලා විද්‍යාලයේ 11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන දීප්තිමත් සිසුවියක වන ඇය විද්‍යාලීය ප්‍රධාන ශිෂ්‍ය නායිකාවද වන්නීය.

ඇය මෙතෙක් ලබා ඇති ජයග්‍රහන රාශියකි. ලෝක ළමා දිනය නිමිත්තෙන් පරණම්බලම බොස්කෝ සෙවන ආයතනය මගින් පැවැත්වූ රචනා තරගයෙන් ප්‍රථම ස්ථානය හිමිකර ගැනීම, 2013 සාහිත්‍ය මාසය වෙනුවෙන් වත්තල ප්‍රාදේශීය සභාව මගින් පැවැත්වූ සාහිත්‍ය තරගාවලියේ රචනා තරගයෙන් දෙවන ස්ථානය හිමිකරගැනීම, බෝපිටිය මීසමේ දහම් පාසල් රචනා තරගයෙන් ප්‍රථම ස්ථානය හා වාර්ෂික පරීක්ෂණයෙන්ද ප්‍රථම ස්ථානය හිමිකර ගැනීම, දහම් පාසල් කථික තරගයෙන් දෙවන ස්ථානය සතුකරගැනීම ඉන් කිහිපයකි.

කුඩා කලදීම පිය සෙනෙහස අහිමිව ගියද තම දයාබර මෑණියන්ගේ සහ ආදරණීය නැගණියන්ගේ නොනිමි සෙනෙහස මැද ''පිනිපොදක කවි සේයා'' නම් වූ නිසදැස් කවි නිර්මාණ එකතුව නොබෝදා එළි දැක්වූවාය.




පමුණුගම පුස්තකාල සහායිකා ඩී.එම් ශිරෝමි පෙරේරා මහත්මිය ඇතුළු පාඨක සමාජයේ සාමාජිකාවන්ගේ නොමඳ සහයෙන් එම බලාපොරොත්තුව ඉටු කරගන්නට හැකි වූ බව ඇය සිහිපත් කරන්නීය. අනුරාධා නිමාෂි දියණියට ළමා ප්‍රදීපය සුබ පැතුම් !

සැම්සන් පෙරේරා

---

## ළමා ප්‍රදීපය....

ළමුන් හැකියා හිනැහී
බලන්නේ කවදාද පිපෙන්නේ කියා
පිපී සුවඳ දී ලොව සරසන්නා වූ
ළමා හැකියා පෙළින් පෙළේ
පදවැල් ගොතලා ගීත තනන්නට
රස වැකි යොදලා කතා ලියන්නට
හැකි විය ළමුනට තම හැකියා තුළ
එවන් හැකියා ලොවට කියන්නට
කිතුනු ළමුනට අත්වැලකි
ළමා ප්‍රදීපය. ළමා ලෝකයේ
සදා බැබළෙන ළමා පුවත්පත
ළමා ප්‍රදීපයට සදා ජය
මා නිරතුරු පතමි



**සජ්නා සෙනේෂි සංජනා**
10 ශ්‍රේණිය
දංකොටුව බාලිකා මහා විද්‍යාලය

## "කිතු යාත්‍රා" පාස්කු කලාපයට ළමා ඔබේ නිර්මාණ යොමු කරන්න.

"කිතු යාත්‍රා" ලේඛක සංසදයේ ප්‍රකාශනයක් වන "මරණයේ අඳුර බිඳ ජීවනයට එතෙර වීම " තේමා කරගත් කුමර නයනජිත් හා ඇන්ටන් ජයසූරියගේ සම සංස්කරණයෙන් එළිදකිනා කිතු යාත්‍රා පාස්කු වාර්ෂිකයේ 8 වෙනි කලාපය මෙවරත් එළි දැක්වේ.

ඒ සඳහා පාස්කු හා සබැඳි ළමා ඔබේ ගද්‍ය, පද්‍ය (සඳැස්, නිසදැස්), චිත්‍ර හා කෙටි කතා මාර්තු 15 දිනට පෙර, ඇන්ටන් ජයසූරිය - සම සංස්කාරක
"කිතු යාත්‍රා" පාස්කු වාර්ෂිකය,
අංක 255/B සාම මාවත,
බෝපිටිය, පමුණුගම. යන ලිපිනයට යොමු කරන්න.

ටයිටස් සපරමාදු

# ක්‍රිස්තියානි ඉතිහාසයේ අසිරිය 45

## නූතන ලෝකය තුළ ක්‍රිස්තියානිය

මේ වන විට ඉතිහාසඥයෝද පැහැදිලිවම පෙන්වා දී තිබුණ පරිදි , පූජාවට සහභාගිවන හැම විටම පූජා භෝජනයටද සහභාගී වී දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගැනීම මුල්කාලීන සම්ප්‍රදාය වී ඇත. ඒ චාරිත්‍රය මධ්‍යකාලීන යුගවලදී මගහැරී ගියේ ය. එසේ වූයේ ඒ කාලයේදී බැතිමතුන් අතර දිව්‍ය සත්ප්‍රසාදය වෙත ඇති කරවන ලද බොරු බිය නිසා ය. ඒ බොරු බිය ජැන්සෙන්තිවරු විසින් පසුකාලීනව නැවතත් පතුරවන ලද්දේය. ඉතිහාසඥයින් විසින් ඔප්පුකරන ලද එම කරුණු හරියාකාර වටහා ගත් පාප්තුමා , මුල්කාලීන සම්ප්‍රදාය වෙත හැරෙමින් දිව්‍ය සත්ප්‍රසාදය නිතර ලබා ගැනීමට බැතිමතුන් උනන්දු කිරීමට තීරණය කළේය. බොරු බිය වෙනුවට නියම භක්ති ආදරයකින් යුතුව දිව්‍ය සත්ප්‍රසාදය නිතර ලබා ගන්නා මෙන් බැතිමතුන්ගෙන් ඉල්ලමින් එතුමන් 1905 දී ආඥාවක්ද නිකුත් කළේය. 10 වෙනි පියුස් පාප්තුමාගේ එම පියවර කතෝලික දේව වන්දනාවට වඩා සප්‍රාණික මට්ටමකට එසවීමට සමත් විය. එතැන් සිට වැඩි දෙනෙක් වැඩි භක්තියකින් දිව්‍ය පූජාවට සහභාගි වූහ.

ආගමික අධ්‍යාපනය සම්බන්ධයෙන්ද එතුමා වැදගත් පියවරක් ගත්තේ ය. මධ්‍යකාලීන යුගයේ විසූ තෝමස් ඇක්වයිනස් තුමන් ශ්‍රේෂ්ඨ ක්‍රිස්තියානි චින්තකයකු සේ දක්වමින් , එතුමාගේ දර්ශණය ක්‍රිස්තියානියේ උසස් අධ්‍යාපනය සඳහාද, විශේෂයෙන් පූජක පුහුණුව සඳහාද, යොදා ගත යුතුයැයි යෝජනා කළේය. ඒ අදහස එතුමාට පෙර වූ 13 වෙනි ලියෝ පාප්තුමන් විසින්ද දරන ලද්දකි. පියුස් පාප්තුමාගේ එම යෝජනාවෙන් කතෝලික සභාවේ උසස් අධ්‍යාපනයට නව පණක් ලැබුණායැයි කිව හැක. බොහෝ දෙනෙක් ශාන්ත තෝමස් තුමාන්ගේ පොත් පත් උද්‍යෝගයෙන් හදාරන්නට පටන්ගත්හ. ''තෝමිස්තවාදය'' කියා නව චින්තන රටාවක්ද බිහිවන්නට විය.

**නූතන චින්තනවාදය**

සාන්ත තෝමස් තුමන්ගේ චින්තන රටාව කතෝලිකයින්ගේ ආදර්ශයට ලක්විය යුත්තක් සේ පාප්තුමන් විසින් යෝජනා කරනු ලැබීමට විශේෂ හේතුවක්ද විය. මේ කාලය වන විට, ඇතැම් ක්‍රිස්තියානි ලේඛකයෝ නූතන විද්‍යාව අනුව ක්‍රිස්තියානි හැඩගැසිය යුතුයැයි කියමින් සම්මත සභා සම්ප්‍රදායට පටහැනි වූ විලාශයකට ඇතැම් ක්‍රිස්තියානි ධර්ම විස්තර කිරීමට පටන්ගෙන සිටියහ. ඒ අදුරදර්ශි ක්‍රියාවලිය පාප්තුමා ''නූතන චින්තනවාදය'' යනුවෙන් නම් කළේය. කතෝලික චින්තකයින් කෙසේ හෝ එයින් බේරා ගැනීම එතුමන්ට අවශ්‍ය විය. ශාන්ත තෝමස් තුමාගේ චින්තනය පෙරමුණට ගෙන ඒමේ එක අරමුණක් එය විය. නූතන චින්තනවාදය, ජැන්සෙනිස්තවාදය ගැන කලින් කී පරිදිම, මිථ්‍යාදෘෂ්ඨියක් සේ ගත යුත්තේම නොවේ. එය ඇතැමුන් විසින් වැරදි අන්තයකට ගෙන යන ලද නමුත් එහි ආරම්භක අරමුණු කිසිසේත් ධර්ම විරෝධි නොවීය. හරි විදියකට ගත් විට එය ආගම දෙස බැලීමට යොදා ගනු ලබන නූතන දෘෂ්ඨිකෝණයක් පමණි. එය ඇරඹුණේ ක්‍රිස්තියානිය හා විද්‍යාව අතර සංවාදයක් ඇති කිරීමේ පරමාර්ථයෙනි. එසේම විද්‍යා ආකල්පවල ආභාෂය මත බොහෝ ක්‍රිස්තු භක්තිකයෝ ක්‍රිස්තියානියෙන් ඈත්වීමට පටන් ගෙන තිබුණ බවක් පෙනෙන්නට තිබුණ නිසා ය. ''මිනිස් වර්ගයාගේ ආරම්භය යන නමින් 1859 දී. ඩාර්වින් විසින් ලියන ලද පොත එවැනි සංවාදයක අවශ්‍යතාවය තදින් පෙන්නුම් කරන අවස්ථාවක් විය.



ගැඹුරු දේව විශ්වාසයකින් යුත් ක්‍රිස්තු භක්තිකයින්ට ඩාවින්ගේ පරිනාමවාද මත ගැටලු සහිත වූයේ නැත. ඔවුන් නිවැරදිව වටහාගෙන සිටි පරිදි, ක්‍රිස්තියානි දේව විශ්වාසයට මුල් වූයේ මුළු මහත් විශ්වාය දේව නිර්මාණයක් යැයි යන අදහස පමණි. එය නිර්මාණය වූයේ කුමණාකාරයකටද කී දිනකින්ද යන අදහස නොවේ. එසේම ක්‍රිස්තියානි ධර්මතාවල හරය කිසිසේත් වෙනස් නොවන විලාශයකට එයට දෙනු ලබන විස්තරය කලින් කලට වෙනස් විය හැකියැයි උගත් බැතිමත්හු දැනගෙන සිටියහ. වත්පිළිවෙත් පවත්වන විධිය සේම ධර්මතාවලට දෙනු ලබන විස්තරද ක්‍රිස්තියානි ඉතිහාසය තුළ වරින් වර වෙනස් වී ඇති බව මොවුහු හොඳ හැටි දැන සිටියහ.

එහෙත් ආගම ධර්මය ගැන එතරම් අවබෝධයක් නොතිබුණු ඇතැම්හු යුක්ති සහගත එවැනි නිගමන වෙනුවට ආගමට අති ශයින් හානි කරවූ තීරණවලට එළඹුණාහ. පැරණි විශ්වාස අලුත් විස්තරවලින් පණගන්වනු වෙනුවට, ඒවා එහෙම පිටින්ම බැහැර කළ යුතුයැයි මොවුහු කීහ. විශ්ව නිර්මාණ පිළිබඳ බයිබල් කථාව, නූතන විද්‍යා ලෝකයට නොගැලපෙන පැරැන්නන්ගේ ජනප්‍රවාදයක් සේ දැක්වූහ.

**ඉදිරියට .......**

**සංස්කාරක පියතුමන් විසිනි**


## පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

“පුංචි අපේ චිත්‍ර පිටුව”
ළමා ප්‍රදීපය,
අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.



අපේ ගෙවත්ත
**රොෂේන්ද්‍රි එලිෂා**
01 ශ්‍රේණිය
සිරිකුරුස විදුහල - ගම්පහ




දෙව්පියා මැව් ලස්සන ලෝකය
**දිනූෂා නිෂාරා සහිදි**
04 ශ්‍රේණිය
යහපත් එඬේරාගේ කන්‍යාරාමය - කොටහේන



ලූර්දු දේව මෑණියන්
**ඇන්ජලා සුලක්ෂනි**
05 ශ්‍රේණිය
ශු. මැක්සිමිලියන් කොල්බේ දහම් පාසල
විශාකාවත්ත




ජේසු සමිඳාණෝ
**කසුන් ප්‍රමෝද් පල්ලෙවෙල**
10 ශ්‍රේණිය
ලොයෙලා විදුහල - මීගමුව



ශු. සෙබස්තියන් මුනිතුමා
**සුමුදු දිව්‍යංගනා රනේපුර**
09 ශ්‍රේණිය
සා. මරියා දහම් පාසල
හපුගොඩ



පලතුරු වට්ටියක්
**දේවින්දි අනුත්තරා**
06 ශ්‍රේණිය
ශු. බෘනෝ මුනිඳු දහම් පාසල - තඹකන්ද




# ශු. පැට්‍රික් මුනිතුමා

මෙතුමා ක්‍රි.ව. 385 දී රෝම පාලකයනට නතුව පැවති බ්‍රිතාන්‍යයේ දී උපත ලැබීය. මෙතුමාගේ පියා රෝම වැසියෙකි. මව ශු. මාර්ටින් තුමාගේ නෑයෙකි. වයස 16 දී මෙතුමාව අයර්ලන්තයේ නායකයන් පිරිසක් විසින් පැහැර ගන්නා ලදි. වසර 06 ක් පුරා අයර්ලන්තයේ එඬේරකු ලෙස ජීවත් වූ අතර එම කාලයේදී යැදුමට හා භාවනාවට මුල් තැනක් ලබා දුනි.



දිනක් මෙතුමා ලද අනාවරණයක් හේතුවෙන් කොල්ලකරුවන්ගෙන් මිදී ආපසු සිය මවුබිමට ඒමට හැකිවිය. මෙලෙස වදකයන්ගෙන් මිදී සිය මවුබිමට පැමිණ සිය පවුලේ අය වලුන් සමග ප්‍රීතියෙන් කාලය ගෙවද්දී දින කීපයක් මෙතුමා කෙරේ අනාවරණ යන් ලද අතර "වික්තෝරියස්" නමින් තමාව අමතන බවද මෙතුමාට ඇසුණි. ඔවුන්ගේ ඉල්ලීම වුයේ " ශුද්ධවු සේවකයාණනි, අප සමග එක්වන්නැ"යි යනුවෙනි. පුදැදුරු වීමේ පරම අභිලාශයෙන් සසුන් ගතව පුජක වරම් ලබා බාධක කම්කටොලු මැද දක්ෂ දේශනාවාදීයකු වූ අතර අවුරුදු 40 දී රාජගුරු පදවියෙන්ද පුදනු ලැබීය.

එක් දිනක් විශාල ජනකායක් ටාරා නම්වූ ගමේ ස්ලෙන් නම් කඳු මුදුනට රැස්ව සිටි අතර එහිදී මෙතුමා ශු. ත්‍රිත්වය පිළිබඳ ගැඹුරු දේවධර්මයක් සරලව ඉදිරිපත් කරමින් ශම්රොක් පත්‍රයක් ගෙන විග්‍රහ කර දුන්නේය. "මේ බලන්න නටුව එකයි, එක සමාන කොළ තුනයි, එක ස්වභාවයි. තුන් දෙනා වහන්සේලාත් මේ වගේ එක ස්වභාවයි. " මෙම ඉගැන්වීම අසා ගෝත්‍රික පිරිසක් මෙතුමා විජ්ජාකරුවකු බවත් තමන්ගේ යක්ෂ මන්ත්‍ර ප්‍රතික්ෂේප කිරීම නිසා කුපිතව මෙතුමන් නසා ලන්නට වෛර දැරුවෝය.


එහෙත් ශු. පැට්‍රික්තුමා ප්‍රබල දේව ඇදහිල්ලෙන් යුතුව ශු. ත්‍රිත්වය පිළිබඳව ගැඹුරින් ම ජනතාව දැනුම්වත් කළේය.

එකල අයර්ලන්තය පාලනය කළ ලියෝගර් රජතුමාද ශු. පැට්‍රික්තුමා කෙරේ පැහැදී නිදහසේ කිතුදහම ප්‍රචාරය කරන්නට අවකාශ ලබා දුනි. මේ සඳහා මෙතුමා තම නිල මුද්‍රාව ද මෙතුමන්ට ලබාදුන් අතර තම පූර්ණ අනුග්‍රහයද නිබදව ලබාදුනි. පුරා වසර 07 ක් ම දැඩි වෙහෙස ගෙන මිසදිටු අයර්ලන්තය සත්‍යාගමික රටක් බවට පත්කළේය. බොහෝ පෙළහර පාමින් අනෙක විද දුක්කරදර මැද මෙතුමන් හා සිය අනුගාමික පිරිස ධර්මදූත මෙහෙවරේ යෙදුනි.

ක්‍රි.ව. 461 දී සුදු පියාණන් වෙතින් ධර්මදූතවරු පිරිසක් එවූ අතර එතැන් පටන් රට පුරා කන්‍යාරාම, පාඨශාලා, තාපසාරාම රාශියක් කරවනු ලැබීය. මේ නිසාම කිතුදහම සීඝ්‍රයෙන් පැතිර ගිය අතර ධර්මය දැඩි ලෙස ප්‍රචලිත වී ධනවත් කුළ පවුල් වලින් තරුණ තරුණියෝ බොහොමයක් තාපසාරාම කරා ආහ. සමහර රජ කුමාරවරු පවා පැවිදි වුහ.

වරෙක මෙතුමා කඳු මුදුනක නැග, යැදුමක සිටි අවස්ථාවක සර්පයෝ රාශියක් ආහ. මෙතුමා උන්ව විසුරුවා හැර මුහුද කරා ඇදී යන්නට අණ දුන් අතර උන්ද විසිර ගියහ. අදත් අයර්ලන්තයේ සර්ප උවදුරු දුරුව පවතී. ක්‍රි.ව. 493 මාර්තු 17 වන දින මෙතුමා අවුරුදු 120 ක් ආයු වළඳා ස්වර්ගස්ථ වුනි. අදත් මෙතුමා අයර්ලන්තයේ ආරක්ෂක මුනිවරයා ලෙස නම් කර ඇත.

අසේල දසනායක



## ප්‍රහේලිකා අංක 43

### හරහට

1. ක්‍රිස්තුන් වහන්සේගේ ගෝලයන් මෙය නොකරන්නේ මන්දැයි ස්නාවක ජුවාම් තුමාගේ ගෝලයෝ ක්‍රිස්තුන් වහන්සේගෙන් ප්‍රශ්න කළෝය.

4. ''.................... කරන්න, ඔබට දොර අරිනු ලැබේ''. ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය

5. ''............. සත්‍යයද, ජීවනයද, මම වෙමි'' ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

7. ක්‍රිස්තුන් වහන්සේ වදාළේ මේවායින් ගස හඳුනාගත හැකි බවයි.

8. නීති විරෝධිවූ ඌරුමස් අනුභව නොකිරීම නිසා මවක් හා දරුවන් සත් දෙනෙකු මර ණයට පත් වූ අයුරු ශුද්ධවූ බයිබලයේ මෙම පොතේ විස්තර වේ.

10. දෙවියන් වහන්සේ තම ස්වරූපය අනුව මිනිසා මවා වදාළ සේක. මෙය..... වන දවසය. මෙහි හිස්තැනට සුදුසු වචනය

### පහළට

1. අසා සිටි සැම දෙනාටම තේරුම් ගත හැකි ලෙස තම ඉගැන්වීම් ඇතැම් විට මේවා මාර්ගයෙන් ක්‍රිස්තුන් වහන්සේ ඉගැන්වූ සේක.

2. ''ඔබේ විරුද්ධ කාරයා සමග උසාවියට යන කල මඟදීම ඉක්මනින් ඔහු හා සමගි වන්න. නැත්තම් ඔබ නඩු කාරයාට බාර දෙන්නේය අන්තිම ...... ට දඬය ගෙවනතෙක් ඔබ කිසිසේත් පිටවී නොයන්නේය'' යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. මෙම දොරටුවෙන් ඇතුල්වන්න වීර්යය කරන්නැයි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක.

6. දෙවියන් වහන්සේට මෙය දක්වන්නන්ගේ ජීවිතය පිළිබඳව උපදේශකයා , හෙවත් සිරාක් විස්තර කරයි.

7. ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ ඇණ ගැසීමට පෙර හේවායෝ මෙම වදන් වලින් උන්වහන්සේට නිගා කළ බව කියැවේ.

9. ක්‍රිස්තුන් වහන්සේව මරණයට පත් කිරීමට පෙර උන් වහන්සේට මේවායින් තැලූ බව කියැවේ.

(මෙම ප්‍රහේලිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු. මාක් 5,7,9 ශු. ලූක් 6, උපදේශකයා හෙවත් සිරාක් 32/14, උත්පත්ති 1 )

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා** - කිරිමැටියාගාර

## පයාගල මීසමේ දහම් පාසල් වල නව ප්‍රබෝධයක්

**පයාගල මීසමේ කුඩා පයාගල සා. මරියා දහම් පාසල හා උතුරු පයාගල ශා. ජෝශප් දහම් පාසල විධිමත් ආකාරයෙන් පවත්වා ගෙන යාමේ අරමුණෙන් එම ළමුන් හා ගුරුවරුන් ශුද්ධවූ සුවිශේෂක වරුන්ගේ නම් වලින් නිවාස 04 කට බෙදා වෙන් කරන ලදි. දහම් පාසල් පරීක්ෂණයේ ලකුණු වලට අමතරව දහම් පාසල් දිව්‍ය පූජාවට පැමිණීම, එම පූජාව සංවිධානය , ඒ සඳහා සහභාගිත්වය , හැසිරීම, විනය, නිවාස මට්ටමින් කුඩා උත්සවයක් පැවැත්වීම ආදි ක්‍රියාකාරකම් වෙනුවෙන්ද ලකුණු ලබාදීමට නියමිතය.**

**ගුරු පියතුමා ප්‍රමුඛ කිසිදු නිවාසයකට අයත් නොවන ස්වාධීන දහම් කමිටුවක් මගින් සියලු ක්‍රියාකාරකම් අධීක්ෂණය කරන අතර, වසර අවසානයේ ලකුණු ලබාදීමේදී මෙම කරුණු ගැනද සැලකිලිමත් වේ. මීසම් සේවක ගුරු සිසිර සමරකෝන් පියතුමාගේ අදහසකට අනුව දහම් ගුරුමඬුල්ලේ සහයෝගයෙන් මෙම කටයුතු ක්‍රියාත්මක කෙරේ.**

**ජී. නිහාල් ප්‍රනාන්දු**

## ඔබ එළිදක්වන පොත්පත් වලට අපෙන් ඉඩක් ...

ඔබ පාසලේ, මීසමේ දහම් පාසලේ එළි දක්වන, ළමා පොත්, සඟරා හා පුවත් පත් පිළිබඳව තොරතුරු අපට ලියා එවන්න. ඒවා ළමා ප්‍රදීපයේ පළ කිරීමට අපි සූදානම්. එම විස්තර පහත ලිපිනයට යොමු කරන්න.

**''පොත් පත්''** ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත - කොළඹ 08


ශුද්ධවූ බයිබලය ඇසුරෙනි
මෝසෙස්
42
චිත්‍ර කථා රචනය ආනන්ද කළුදේව
ඔහුගේ දෙබස් හා චිත්‍ර
ඔහෝ.. අයියෝ මේ මොකක්ද සිදුවී තිබෙන්නෙ.. මගේ වැඩිමහල් දරුවා මියගිහින්...
පසුදා උදෑසන
අනේ මොකද මේ ලොකු පුතාට වෙලා තියෙන්නෙ.. කථා කරන්නකෝ දරුවා.. ...කථා කරන්න...
ඊජිප්තු ජාතිකයින්ට දෙවියන් වහන්සේ මේ අයුරින් දඬුවම් දුන්නේය.. ඊජිප්තු ජාතිකයන්ගේ සෑම පවුලකම වැඩිමහල් දරුවන් එදින උදෑසන මරණයට පත්ව තිබුණි... මිනිසුන්ට අමතරව සතුන්ද එයට ගොදුරුවී සිටියහ...
රජ මාළිගාවේ..
රජතුමනි..
..රජතුමනි.. ඔබේ වැඩිමල් පුතුයා ඊයේ රාත්‍රී මිය ගිහින් සෑම ඊජිප්තු පවුලකම වැඩිමල් දරුවන් රාත්‍රී මිය ගිහින්...
මොනවාහ්
අහෝ මා පුතුයා තමක්ද රජතුමනි මේ සිදුවූ ඇති විපත...
සේවකයිනි.. මෝසෙස් හා ආරොන් වහාම මෙහි කැඳවාගෙන එනු
මෝසෙස් ඊයෙ රෑ අපේ වැඩිමල් දරුවො ඔක්කොම මැරිල.. තමේ මිනිස්සුයි සත්තුයි ඔක්කොම අරං පලයල්ලා... නුඹලා වහාම මෙහෙන් පිට නුනොත් අපවත් බැරේවි.. පලයල්ලා..
දෙවියන් වහන්සේට නමස්කාර කිරීමට නුඹලාගේ සියළුම සෙනඟ සමඟ මෙහෙන් පිට වෙයල්ලා.. ගිහින් දෙවියන් වහන්සේට පූජා ඔප්පු කරල අපටත් දින්වහන්සේගෙ පිහිට ලැබෙන්ට සලස්වා පල්ලා...

ළමා ප්‍රදීපය





# නායකකන්ද කනිෂ්ඨ දහම් පාසල 'මරිය වසරට' සූදානම් වෙයි !

නායකකන්ද කනිෂ්ඨ දහම් පාසල් දරුදැරියන් සිය දහම් පාසල් ගුරුවරුන් හා දෙමව්පියන් සමඟ එක්ව 'මරිය වසරට' සූදානම් වෙමින් මරිමව් බැතිය, ජපමාලය තේමා කරගනිමින් අත්කම් ප්‍රදර්ශනයක් හා සංස්කෘතික සංදර්ශනයක් පවත්වනු ලැබීය.

**සටහන/ ඡායාරූප: තිළිණ අලහකෝන්**



# JOSEPH VAZ

Part -01

Joseph Vaz was a man who heard the sad plight of Sri Lankan Catholics and was moved so much to help them that while engaged in pastoral work in Kanara, he even thought of having himself sold as a slave to Dutch traders form Sri Lanka in the hope of getting into the island that way.



Joseph Vaz was born to Christopher Vaz and Maria Miranda on April 21, 1651, in a quiet little village of Benaulim, Goa.



His father had a mysterious conviction, as he himself has recorded it: "In course of time my son will achieve greatness".